**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 07 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 13 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් සභාව සතු ඉඩම් 22 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු සියළු ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. | අදාල ඉඩම් 22 හි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග අයිතම් 02 ක වටිනාකම රු. 76,189 ක් වැඩියෙන් හා තොග අයිතම් 03 ක වටිනාකම රු. 17,845 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | තොග වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කළ බවත්, ඉදිරියේදී එවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල සභාවේ ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම් සඳහා වැය කරන ලද රු. 576,953 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ජංගම නොවන වත්කම් වැඩිවීම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | ඉදිරියේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු ප්‍රතිපාදනය කර නොතිබුණි. | වර්ෂයට අදාලව දැරිය යුතු වියදම් සඳහා මූල්‍ය ප්‍රකාශන තුල වෙන්කිරීම් සිදුකළ යුතුවේ. | ඉදිරියේදී විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට අත්තිකාරම් ලේඛනය හා අත්තිකාරම් පාලන ගිණුම අතර රු. 2,766,261 ක වෙනසක් පැවතුණි. | පාලන ගිණුම්වල ශේෂ ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුවේ. | පසුගිය ලේඛනවල තොරතුරු සොයා බලා නිවැරදි කිරීමේ කටයුතු මේ වනවිට සිදු කරමින් පවතින බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | | |
| (i) | 24 (1) (අ) හා (ආ) වගන්ති | සභාව සතු පාරවල් සහ පටුමාවත්වල සැලැස්මවල් පිළියෙල කිරීමට සහ ඒවායේ නාමලේඛන දැක්වීමට 2003 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මාර්ග ගැසට් කිරීමට පෙර සියළු මාර්ග සඳහා පිඹුරු පත් සකස් කළ යුතු අතර, ඒ සඳහා මිල ගණන් කැඳවීම් කළද මේ වනවිටත් ඒ සඳහා මිල ගණන් ලැබී නොමැති බවත් මිනින්දෝරු නිලධාරින්ගේ සේවය ලබා ගැනීම සඳහා නැවත මිල ගණන් කැඳවීමක් කර මාර්ග ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු කරන බවත් දන්වමි. |
| (ii) | 134 වගන්තිය | සභාවේ දියුණු ගම් ප්‍රදේශ ලෙස 2015 වර්ෂයේ හඳුනාගෙන තිබූ ප්‍රදේශ දියුණු ගම් ප්‍රදේශ ලෙස නම් කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දියුණුගම් ප්‍රදේශ නම් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව දන්වමි. |
| (iii) | 149 වගන්තිය | සභා බල ප්‍රදේශය තුල පිහිටි ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද හෝටල්, ආපනශාලා හෝ නවාතැන්පලවල් 04 කින් 2018/2019 වර්ෂයට අදාල ආදායමින් අයකල යුතු සියයට 01 දක්වා වූ බද්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් හෝටල් වසා තිබූ බැවින් අයකර ගැනීමේ ප්‍රමාදයක් සිදුවූ බවත් මේ වනවිට අදාළ ආයතන දැනුවත් කර ඇති බවත් දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 104 | සභාවේ කැබ් රථයක් අනතුරට පත්වීමෙන් සිදු වූ අලාභ හානි සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති නමුත් මේ වනවිටත් පරීක්ෂණය සිදු කර නොමැති බව දන්වමි. |
| (ii) | මුදල් රෙගුලාසි 371(5) | 2002 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිකුත් කර තිබුණු එකතුව රු. 5,314,427 ක් වූ අත්තිකාරම් 112 ක් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2002 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වූ නොපියවූ අත්තිකාරම් කපා හැරීමට මේ වනවිට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |
| (ඇ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය | ප්‍රජාපාදක සංවිධානවල සුදුසුකම් පරීක්ෂා නොකර රු. 9,863,066 ක් වටිනාකමැති කොන්ත්‍රාත් 12 ක් ප්‍රජාපාදක සංවිධානවලට පවරා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල ප්‍රජා සංවිධානය ලියාපදිංචි වී ඇති ප්‍රාදේශීය ලේකම් ගොවිජන සේවා වැනි ආයතන මඟින් ලබා දෙන හැකියා සහතිකය පදනම් කර ගනිමින් කර්මාන්ත ප්‍රදානය කිරීම සිදුකර ඇති බවත්, ප්‍රාදේශීය ලේකම්ගේ නියෝජිතයන් ඇතුලත් කමිටුව පත්කර ප්‍රජා සංවිධාන තෝරා ගැනීමේ අපහසුතාවක් ඇති බවත් දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,687,248 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,086,825 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,238,538 | 9,404,694 | 7,534,479 | 6,388,034 | 5,719,099 | 7,839,351 | 6,330,106 | 5,341,086 |
| කුලී | 2,229,000 | 1,295,322 | 1,295,321 | 33,660 | 352,000 | 1,601,615 | 1,613,615 | 33,660 |
| බලපත්‍ර ගාස්තු | 1,247,000 | 1,077,544 | 1,077,544 | - | 1,161,000 | 1,762,591 | 1,762,591 | - |
| වෙනත් ආදායම් | 24,397,500 | 14,072,030 | 23,290,544 | 27,825,887 | 17,468,000 | 13,208,728 | 11,027,164 | 37,154,976 |
| | 35,112,038 | 25,849,590 | 33,197,888 | 34,247,581 | 24,700,099 | 24,412,285 | 20,733,476 | 42,529,722 |

## 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම්** | | |
| | ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වරිපනම් හා බදුවල හිඟ හිටි ආදායම රු. 1,046,948 කින් වැඩි වී තිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ගිනිගෙන විනාශ වූ තේ කර්මාන්ත ශාලාවට අදාළ වරිපනම් කපා හැරීමට ඉල්ලීම් කිරීම මේ වනවිට සිදු කරමින් පවතින බවත්, ඉදිරියේදී ජංගම සේවයක් පවත්වා සෙසු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ)** | **අක්කර බදු** | | |
| | ඉකුත් වර්ෂයට හිඟව තිබූ අක්කර බදු රු. 101,270 කින් රු. 96,861 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අක්කර බදු සතොක්ෂණයක් සිදුකර හිඟ ආදායම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අක්කර බදු ගෙවන්නන්ගෙන් විශාල පිරිසකගේ ඉඩම් කට්ටි වීම නිසා බදු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර හිඟ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී. |
| **(ඇ)** | **කසළ බදු** | | |
| | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (2) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල පිහිටි ව්‍යාපාරික ස්ථාන හා නිවාස 71 කින් 2010 වර්ෂයේ සිට අයවිය යුතු රු. 315,000 ක කසල බදු අයකරගෙන නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 ජූනි මස සිදුකළ ජංගම සේවා වැඩසටහන මඟින් හිඟ කසළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ බව දන්වමි. |

**2.2.3 වෙනත් ආදායම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පානීය ජල ව්‍යාපෘති 10 කින් හිඟව තිබූ ජල ගාස්තු රු. 3,517,866 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී ජංගම සේවා 02 ක් පවත්වා හිඟ ජල ගාස්තු රු. 115,000 ක් අයකරගත් අතර ඉතිරි හිඟ අයකර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | සභා බල ප්‍රදේශයට අයත් වසම් 26 ක දැන්වීම් පුවරු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සෙසු වසම් 24 ක ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 417 ක් සඳහා ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් හඳුනාගෙන රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා සකස් කර අවශ්‍ය අනුමැතිය සඳහා මේ වනවිටත් ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයට අදාළව අයවිය යුතු උසාවි දඩ රු. 11,553,490 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | උසාවි දඩ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව විසින් යන්ත්‍ර කුලියට දීම, ජල | අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රචාරණ දැන්වීම් අතුරු ව්‍යවස්ථාව සකස් කර 2020 මැයි 11 දින සභාවට ඉදිරිපත් |

| | |
|---|---|
| සම්පාදනය හා ජල ව්‍යාපෘති කළමනාකරණය, ප්‍රචාරණ දැන්වීම් විධිමත් කිරීම, පරිපාලනය කිරීම, අධීක්ෂණය කිරීම සහ දැන්වීම් පුවරු ගාස්තු අයකිරීම සඳහා සහ ගිමන්හල ගාස්තු නියාමන කටයුතු වලට අදාලව අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවද, ඒ සඳහා 2020 මැයි වනවිටත් කටයුතු කර නොතිබුණි. | කර අනුමත කර ඉදිරි කටයුතු සඳහා යොමුකර ඇති බවත්, අනෙකුත් විෂයයන් සඳහා ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බල ප්‍රදේශය තුළ පිහිටි ගිමන්හලක කුළී නොගෙවීම සම්බන්ධයෙන් සභාව විසින් ගන්නා ලද අධිකරණ ක්‍රියාමාර්ගයට අනුව රු. 72,048 ක් වූ සම්පූර්ණ හිඟ මුදල 2019 ජූලි වනවිට අයකර අවසන් වියයුතු වුවත්, තවදුරටත් රු. 49,048 ක් අයවිය යුතුව තිබුණි. | ගෙවීම් පැහැරහැරීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

--------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලේකම් තනතුර පුරප්පාඩු වීම නිසා ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා 2014 වර්ෂයේ දී රාජ්‍ය කළමනාකරණ 1 ශ්‍රේණියේ නිලධාරියෙකු පළාත් පාලන කොමසාරිස් විසින් පත්කර තිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සෑම වසරකම කාර්තුවක් පාසා කාර්යය මණ්ඩල තොරතුරු සමඟ සියළු පුරප්පාඩු සම්බන්ධව පළාත් පාලන සහකාර කොමසාරිස් මඟින් ප්‍රධාන ලේකම් දැනුවත් කර ඇති බව දන්වමි. |
| (ආ) | පුරප්පාඩු වූ තාක්ෂණික සේවා නිලධාරි තනතුරක්, පුස්තකාලයාධිපති තනතුරක් හා ආයුර්වේද ඖෂධ තනතුරක් පිරවීමට කටයුතු කර නොතිබීමෙන් අදාල කාර්යය හා කර්තව්‍යයන් කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කිරීමට බාධා වී තිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල තනතුරු පුරප්පාඩුව පිළිබඳව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇති බව දන්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සංවර්ධන නිලධාරී තනතුරු 02 ක් 2017 වර්ෂයේ සිට අතිරික්තව පැවතුණි. | අතිරික්ත විධිමත් කළ යුතුවේ. | සංවර්ධන නිළධාරී තනතුරු දෙකක අතිරික්තය පිළිබඳව කාර්යය මණ්ඩල තොරතුරු සමඟ පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත දන්වා යවා ඇති බව දන්වමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

## 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු. 128,355,776 ක් වූ වත්කම් විෂයයන් 04 කට අදාලව ස්ථාවර වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | වත්කම් ලේඛන හා විස්තරාත්මක උපලේඛන යාවත්කාලීනව නඩත්තු කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛන නඩත්තු කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

## 3.4.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු. 1,550,000 ක් වූ අයත් ගලි බවුසරය 2010 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | ගලි බවුසරය ඵලදායී ලෙස උපයෝජනය කිරීමට හෝ අවශ්‍යතාවය සහිත වෙනත් පළාත් පාලන ආයතනයක් වෙත ලබාදීමට කටයුතු කළ යුතුවේ. | අපද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථානයක් නොමැති බැවින් ගලි බවුසරය ප්‍රයෝජනයට ගත නොහැකි බව දන්වමි. |
| (ආ) | රු. 42,000,000 ක් වැය කර ඉදිකර තිබූ ගලගම බහු කාර්යය ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නිෂ්කාර්යයව පැවතුණි. | අදාල ගොඩනැගිල්ල ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුවේ. | අදාල ගොඩනැගිල්ල ආදායම් උත්පාදනය කිරීමේ වැඩසටහනකට යෙදවීමට සැලසුම් කර අවශ්‍ය ප්‍රතිපාදන පළාත් සභාවෙන් ලබා ගැනීමට කටයුතු කර තිබුණද, එම ප්‍රතිපාදන නොලැබීම හා සභාවේ අයහපත් මූල්‍යය තත්ත්වය හේතුවෙන් එම කටයුතු ඉටුකර ගැනීමට නොහැකි වූ බව දන්වමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**----------------**

**කොන්ත්‍රාත් පරිපාලනය**

**----------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ----------------------------- |
| (අ) | 2015 වර්ෂයේ ඉදිකරන ලද කැපොක්වත්ත කසළ කළමනාකරණ පරිශ්‍රයේ ඇති කොන්ක්‍රීට් මාර්ග තලයේ දිග මීටර් 7.7 ක් සහ පළල මීටර් 1.5 ක් වු කොටසක් කැඩී මාර්ගයෙන් පිටතට තල්ලු වී තිබුණද, රු. 83,652 ක් වු රඳවාගැනීමේ මුදල් භාවිතා කර එය පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණි. | රැඳවුම් මුදල් භාවිතා කර කැඩී ඇති කොටස පිළිසකර කිරීමට කටයුතු කළ යුතුවේ. | කැඩී ඇති කොටස කොන්ත්‍රාත්කාර පාර්ශවය ලවා ඉටුකර ගැනීමට කටයුතු කලද, මේ වනතෙක් එය ඉටු වී නොමැති බැවින් රැඳවුම් මුදල් භාවිතා කර මාර්ග තලයේ කැඩී ගොස් ඇති කොටස් ඉදිරියේදී පිළිසකර කිරීමට බලාපොරොත්තු වන බව දන්වමි. |
| (ආ) | පින්නවල පානීය ජල ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීමේ කර්මාන්තය දින 24 ක කාලයක් තුළ නිම කිරීමේ පදනමින් 2017 නොවැම්බර් 20 දින කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. කොන්ත්රාත්කරු විසින් මිළදී ගන්නා ලද රු. 1,440,500 ක් වටිනා ජලනල උපාංග සහා භූමියේ රුස්කර තිබුණු අතර ඒ සඳහා රු.1,152,684 ක් ගෙවා තිබුණ ද ජල නල එලීමේ කටයුතු 2020 මාර්තු දක්වා සිදුකර නොතිබීම හේතුවෙන් පැරණි ජල නල පුපුරා මාර්ග වලටද හානි සිදුවී තිබුණු අතර, ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි නිම කිරීමට කටයුතු කළ යුතු අතර, ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම කර්මාන්තයේ කටයුතු කොන්ත්‍රාත්කාර පාර්ශවය විසින් නිසි ලෙස ඉටුකර නොමැති බැවින් වැඩ වටිනාකමින් සියයට 15 ක මුදලක් රඳවාගෙන ඇති බවත්, ඍජු කම්කරු ශ්‍රමය යොදා එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට සභා තීරණයක් ගෙන ඇති බැවින් කඩිනමින් නල එළිම් කටයුතු සිදු කරන බවත් දන්වමි. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**-----------------------------------------------**

**නොවිසඳී ඇති නිරීක්ෂණ**

**---------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පඹහින්න සතිපොළ සංවර්ධනය සඳහා 2015 සහ 2017 වර්ෂයන්හිදී රු. 4,561,397 ක් වැයකර තිබුණද, ඉතිරි ප්‍රතිපාදන නොලැබීම මත පොළ පැවැත්වීමට සුදුසු පරිදි සංවර්ධන කටයුතු සිදුකර නොතිබුණි. | සතිපොළ සංවර්ධනය කර ප්‍රයෝජනයට ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2017 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ මෙම ඉඩම් කොටසේ සතිපොළ ඉදිකිරීමට තීරණය කරන ලදුව රු. 4,561,397 ක් යොදවා සතිපොළ ඉදි කිරීමේ මූලික අදියර අවසන් කළත් සතිපොළ පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉදිරි සංවර්ධන කටයුතු නතර වී ඇති බව දන්වමි. |